# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk



ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2021 අගෝස්තු 13 |

# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2021 ජූනි

## සමස්ත නිරීක්ෂණ

වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වෙළඳ ගිණුමේ හිඟය 2021 වසරේ ජූනි මාසයේ දී අඛණ්ඩව සිව්වන වරටත් පුළුල් විය. 2020 වසරේ ජූනි මාසයට සාපේක්ෂව, 2021 වසරේ ජූනි මාසයේ දී අපනයන මෙන්ම ආනයන ද සැලකිය යුතු ලෙස ඉහළ අගයක පැවතුණි. වසරේ මුල් භාගය සලකා බැලීමේ දී අපනයන අංශය හිතකර වර්ධනයක් වාර්තා කළ ද, ආනයන වියදම ඉහළ වේගයකින් වර්ධනය විය. 2020 වසරේ ජූනි මාසයට සාපේක්ෂව 2021 වසරේ ජූනි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ පහළ ගිය අතර, සංචාරක අංශයේ ඉපැයීම් අවම මට්ටමක පැවතුණි. මූල්‍ය ගිණුම සැලකීමේ දී, මාසය තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි සහ කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන ගෙවීම් සුළු ප්‍රමාණයක් වාර්තා විය. ශ්‍රී ලංකා රුපියල 2021 වසරේ ජූනි මාසයේ දී සමස්තයක් ලෙස ස්ථාවරව පැවතුණි.

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2020 ජූනි එ.ජ.ඩො. මිලියන | 2021 ජූනි එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2020 ජන.- ජූනි එ.ජ.ඩො. මිලියන | 2021 ජන.- ජූනි එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 894 | 1,007 | 12.6 | 4,413 | 5,699 | 29.1 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,055 | 1,659 | 57.2 | 7,675 | 10,015 | 30.5 |
| වෙළඳ ශේෂය | -161 | -652 | | -3,262 | -4,316 | |
| සංචාරක ඉපැයීම් | - | 2(ඇ) | - | 682(ආ) | 23(ඇ) | -96.7 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 572 | 478 | -16.4 | 2,980 | 3,324 | 11.6 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -46 | -6 | | -111 | -125 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 121 | 175 | | 1,213 | 1,174 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර (දළ) | 3 | 0.1 | | 90 | 14 | |
| දිගුකාලීන ණය (දළ) | 118 | 175 | | 1,124 | 1,160 | |
| විදේශ සෘජු ආයෝජන (දළ) (ඉ) | | | | 188 | 198 | |
| සමස්ත ශේෂය | | | | -760 | -1,261 | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2021 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත් වේ.
(ඉ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස තුන සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් ‘මාසික වෙළඳ විවරණිකාව’ ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

## වෙළඳ ශේෂය සහ වෙළඳ මිල අනුපාතය

**වෙළඳ ශේෂය:** වෙළඳ ගිණුමේ හිඟය, 2020 වසරේ ජූනි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 161ට සාපේක්ෂව, 2021 වසරේ ජූනි මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත එ.ජ. ඩොලර් මිලියන 652ක් දක්වා පුළුල් විය. 2021 වසරේ පළමු භාගය තුළ සමස්ත වෙළඳ ගිණුමේ හිඟය, 2020 හා 2019 වසරවල අනුරූප කාලපරිච්ඡේද තුළ පිළිවෙළින් වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,262ක සහ එ.ජ. ඩොලර් මිලියන 3,597ක හිඟයයන්ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 4,316ක් දක්වා පුළුල් විය. වෙළඳ ගිණුමේ සමස්ත හිඟය පුළුල් වීම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූප සටහන 1 මගින් දැක්වේ.

**වෙළඳ මිල අනුපාතය:** අපනයන සහ ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය, 2020 වසරේ ජූනි මාසයට සාපේක්ෂව 2021 වසරේ ජූනි මාසයේ දී සියයට 16.7කින් පහළ ගිය අතර, 2020 වසරේ ජූනි මාසයට සාපේක්ෂව, අපනයන මිල ගණන් ඉහළ යෑමට වඩා වැඩි වේගයකින් ආනයන මිල ගණන් ඉහළ යෑම මේ සඳහා හේතු විය.

**රූප සටහන 1: 2021 වසරේ ජනවාරි - ජූනි කාලපරිච්ඡේදය තුළ වෙළඳ හිඟය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ යෑම සඳහා දායක වූ ප්‍රධාන අයිතම (අගයයන්- එ.ජ. ඩොලර් මිලියනවලිනි)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2020-2021)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2020-2021)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරීත්වය[1]

**සමස්ත අපනයන**: **වෙළඳ භාණ්ඩ අපනයන ආදායම, 2021 වසරේ ජූනි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,007ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 12.6කින් ඉහළ ගියේය.** 2021 වසරේ ජනවාරි සිට ජූනි දක්වා සමස්ත අපනයන ආදායම, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 4,413ට සහ 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 5,999ට සාපේක්ෂව, එ.ජ. ඩොලර් මිලියන 5,699ක් ලෙස වාර්තා විය. 2021 මැයි මාසයට සාපේක්ෂව 2021 ජූනි මාසයේ දී අපනයන සියයට 12.9කින් වර්ධනය විය.

**කාර්මික අපනයන:** පුළුල් පදනමක් යටතේ බොහෝ අපනයන කාණ්ඩවල ආදායම ඉහළ යෑම හේතුවෙන්, කාර්මික භාණ්ඩ අපනයන ආදායම 2020 වසරේ ජූනි මාසයට සාපේක්ෂව, 2021 වසරේ ජූනි මාසයේ දී සියයට 16.6කින් ඉහළ ගියේය. රබර් නිෂ්පාදිත (ටයර් සහ අත්වැසුම්), ඛනිජ තෙල් නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ (සියලුම උප කාණ්ඩ), රෙදිපිළි සහ ඇඟලුම්, මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ හා මූල ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත සම්බන්ධයෙන් සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය. ඛනිජ තෙල් නිෂ්පාදිතවලින් ලැබෙන ආදායම ඉහළ යෑම සඳහා ඉන්ධන පරිමාවන් තරමක් ඉහළ යෑම සමඟ නැව් සඳහා යොදාගනු ලබන ඉන්ධනවල

[1] සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව අපනයන සංයුතිය ඇමුණුම Iහි දක්වා ඇත.

ඒකක අගය සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතු විය. වසංගතය ආශ්‍රිත අවහිරතා අඛණ්ඩව පැවතිය ද, ප්‍රධාන අපනයන කාණ්ඩවල ආදායම මාසික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ ගියේය. 2021 වසරේ ජනවාරි සිට ජූනි දක්වා කාලපරිච්ඡේදය තුළ කාර්මික අපනයනවලින් ලද සමස්ත ආදායම, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 31.3ක වර්ධනයක් සහිතව එ.ජ. ඩොලර් මිලියන 4,408ක් දක්වා ඉහළ ගියේය.

**කෘෂිකාර්මික අපනයන**: 2021 වසරේ ජූනි මාසයේ දී සමස්ත කෘෂිකාර්මික භාණ්ඩ අපනයන ආදායම 2020 ජූනි මාසයේ දී වාර්තා වූ අගයයන් හා සමානව පැවතුණි. අපනයන ඒකක වටිනාකම පහළ ගිය ද, අපනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් තේ අපනයන ආදායම ඉහළ ගියේය. තව ද, පොල් (මද ආශ්‍රිත මෙන්ම මද ආශ්‍රිත නොවන පොල් නිෂ්පාදිත), කුළුබඩු (ගම්මිරිස් සහ කරාබු නැටි වැනි) සහ සකස් නොකළ දුම්කොළ අපනයනයෙන් ලද ආදායම ඉහළ ගියේය. මීට ප්‍රතිවිරුද්ධව, මුහුදු ආහාර, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත (පළතුරු, පුවක්, බුලත් කොළ යනාදී) සහ එළවළු (නැවුම්, ශීත කළ, වියලන ලද, කල් තබා ගත්  යනාදී) අපනයනයෙන් ලද ආදායම පහළ ගියේය. 2021 වසරේ මුල් භාගයේ දී කෘෂිකාර්මික අපනයනවලින් ලද සමස්ත ආදායම, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 21.2ක වර්ධනයක් සහිතව එ.ජ. ඩොලර් මිලියන 1,259ක් දක්වා ඉහළ ගියේය.

**ඛනිජ අපනයන**: පාෂාණ සහ ගල් වර්ග මෙන්ම ලෝපස්, ලෝබොර සහ අළුවලින් ලද ආදායම ඉහළ යෑම හේතුවෙන් ඛනිජ අපනයන ආදායම 2020 වසරේ ජූනි මාසයට සාපේක්ෂව 2021 වසරේ ජූනි මාසයේ දී ඉහළ ගියේය. 2021 වසරේ ජනවාරි සිට ජූනි දක්වා කාලය තුළ ඛනිජ අපනයනයෙන් ලද සමස්ත ආදායම එ.ජ. ඩොලර් මිලියන 25කි.

**අපනයන දර්ශක:** 2021 වසරේ ජූනි මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අපනයන පරිමා සහ ඒකක මිල දර්ශක පිළිවෙළින්, සියයට 8.9කින් සහ සියයට 3.4කින් ඉහළ ගියේය. මෙමගින්, අපනයන ආදායම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ යෑම සඳහා අපනයන පරිමා සහ මිල ගණන් ඉහළ යෑමේ ඒකාබද්ධ බලපෑම හේතු වූ බව නිරූපණය වේ.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: මාසික අපනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)

| කාණ්ඩය | ජුනි 2020 (එ.ජ.ඩො. මිලියන) | ජුනි 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- ජුනි 2020 (එ.ජ.ඩො. මිලියන) | ජන.- ජුනි 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **661.3** | **771.4** | **16.6** | **3,357.1** | **4,407.7** | **31.3** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 41.7 | 41.7 | 0.0 | 197.8 | 248.0 | 25.4 |
| සත්ත්ව ආහාර | 11.3 | 8.7 | -22.9 | 49.2 | 58.9 | 19.6 |
| රෙදිපිළි හා ඇඟලුම් | 403.7 | 415.5 | 2.9 | 1,943.9 | 2,487.4 | 28.0 |
| එයින්, ඇඟලුම් | 323.0 | 376.6 | 16.6 | 1,734.2 | 2,267.5 | 30.8 |
| රෙදිපිළි | 20.8 | 30.0 | 44.2 | 105.9 | 156.6 | 47.8 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 59.8 | 8.8 | -85.3 | 103.8 | 63.3 | -39.0 |
| රබර් නිෂ්පාදිත | 66.0 | 92.9 | 40.7 | 335.7 | 499.7 | 48.8 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 11.2 | 21.2 | 89.5 | 72.7 | 132.1 | 81.6 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 30.2 | 45.2 | 49.8 | 146.5 | 242.1 | 65.3 |
| ප්‍රවාහන උපකරණ | 7.7 | 12.8 | 66.8 | 30.9 | 54.8 | 77.4 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 16.7 | 41.3 | 147.3 | 219.5 | 196.7 | -10.4 |
| රසායනික නිෂ්පාදිත | 16.0 | 21.8 | 35.9 | 75.3 | 109.6 | 45.5 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 8.0 | 11.3 | 40.2 | 44.4 | 60.6 | 36.5 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.9 | 2.2 | 11.3 | 15.1 | 26.3 | 74.4 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 5.9 | 4.7 | -20.1 | 26.1 | 22.5 | -13.7 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.9 | 7.6 | 11.4 | 26.7 | 37.5 | 40.7 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 9.6 | 17.8 | 84.9 | 55.5 | 73.2 | 31.9 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 1.4 | 3.3 | 134.4 | 9.1 | 17.6 | 94.1 |
| වෙනත් කාර්මික අපනයන | 23.2 | 23.4 | 1.1 | 108.7 | 140.7 | 29.4 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **229.1** | **230.3** | **0.5** | **1,039.0** | **1,258.9** | **21.2** |
| තේ | 114.9 | 123.9 | 7.8 | 571.7 | 650.5 | 13.8 |
| රබර් | 2.9 | 2.6 | -8.5 | 13.5 | 20.3 | 50.7 |
| පොල් | 34.2 | 38.6 | 12.7 | 146.8 | 196.2 | 33.7 |
| කුළුබඩු | 31.5 | 35.5 | 12.8 | 113.8 | 196.8 | 72.9 |
| එළවළු | 3.9 | 1.9 | -51.8 | 13.8 | 12.2 | -12.2 |
| සකස් නොකළ දුම්කොළ | 1.3 | 3.1 | 133.4 | 9.5 | 16.2 | 69.4 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 16.0 | 8.9 | -44.6 | 70.7 | 60.4 | -14.6 |
| මුහුදු ආහාර | 24.3 | 15.8 | -35.1 | 99.1 | 106.4 | 7.3 |
| **3. ඛනිජ අපනයන** | **1.6** | **4.4** | **172.3** | **9.7** | **24.9** | **155.6** |
| **4. වර්ග නොකළ අපනයන** | **2.1** | **0.9** | **-54.8** | **7.0** | **7.5** | **8.0** |
| **මුළු අපනයන** | **894.1** | **1,007.0** | **12.6** | **4,412.8** | **5,699.0** | **29.1** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය[2]

**සමස්ත ආනයන: 2020 වසරේ ජූනි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,055ට සාපේක්ෂව, වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,659ක් දක්වා සියයට 57.2කින් ඉහළ ගියේය.** 2021 වසරේ ජූනි මාසයේ දී ආනයන පරිමා අඩු වීම හේතුවෙන් ඛනිජ තෙල් ආනයන මත වන වියදම් අඩු වුව ද, පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ යන සියලුම ප්‍රධාන ආනයන කාණ්ඩ සඳහා ආනයන වියදම ඉහළ යෑමක් දක්නට ලැබුණි. සමුච්චිත පදනම මත, 2021 වසරේ මුල් භාගයේ සමස්ත ආනයන වියදම, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 7,675 හා 2019 අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 9,596ට සාපේක්ෂව, එ.ජ. ඩොලර් මිලියන 10,015ක් ලෙස වාර්තා විය.

**පාරිභෝගික භාණ්ඩ**: ආහාර හා පාන වර්ග සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය කිරීම සඳහා වූ වියදම වසරකට පෙර පැවති අගයට සාපේක්ෂව, 2021 වසරේ ජූනි මාසයේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මුහුදු ආහාර හැර සෙසු සියලුම කාණ්ඩවල ආනයන වියදම සමස්ථයක් ලෙස ඉහළ යෑම හේතුවෙන්, ආහාර සහ පාන වර්ග සඳහා වන වියදම එ.ජ. ඩොලර් මිලියන 165.0ක් දක්වා සියයට 61.9කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, මුළු ආහාර පිරිවැය ඉහළ යෑමට කිරි නිෂ්පාදන (ප්‍රධාන වශයෙන් කිරිපිටි, එමෙන්ම චීස් සහ බටර්) හා තෙල් සහ මේද වර්ග (ප්‍රධාන වශයෙන් පොල්තෙල්, එමෙන්ම වෙනත් තෙල් වර්ග) විශාල වශයෙන් හේතු විය. ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා වන වියදම එ.ජ. ඩොලර් මිලියන 217.2ක් දක්වා සියයට 47.6කින් ඉහළ ගිය අතර, එයට ප්‍රධාන වශයෙන් බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් එන්නත්), ගෘහ උපකරණ (රූපවාහිනී, රයිස් කුකර්, විදුලි පංකා, ශීතකරණ යනාදී), ජංගම දුරකථන, රබර් ටයර් සහ ටියුබ් යනාදිය හේතු විය. 2021 වසරේ මුල් භාගයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයනය කිරීම සඳහා වූ මුළු වියදම එ.ජ. ඩොලර් මිලියන 1,912ක් වූ අතර, එය 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 7.3ක වර්ධනයකි.

**අන්තර් භාණ්ඩ:** ඉන්ධන සඳහා වන ආනයන වියදම සියයට 40.0කින් පහළ ගිය ද, 2021 වසරේ ජූනි මාසයේ දී අන්තර් භාණ්ඩ ආනයනය කිරීම සඳහා වන වියදම, 2020 වසරේ ජූනි මාසයට සාපේක්ෂව සියයට 48.5කින් ඉහළ ගියේය. ප්‍රමාණවත් තොග පැවතීම සැලකිල්ලට ගෙන බොරතෙල් ආනයනය නොකිරීම සහ අනෙකුත් ඛනිජ තෙල් වර්ග ආනයන පරිමාව අඩු වීම හේතුවෙන් ඉන්ධන සඳහා වන පිරිවැය පහළ ගියේය. රටේ ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ යෑම මෙන්ම ලෝක වෙළඳපොළ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම හේතුවෙන්, පොහොර, ඛනිජ

[2] සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව ආනයන සංයුතිය ඇමුණුම IIහි දක්වා ඇත.

.

නිෂ්පාදිත සහ සකස් නොකළ දුම්කොළ හැර අනෙකුත් අන්තර් භාණ්ඩ සියල්ලෙහිම පාහේ ආනයන වියදම ඉහළ ගියේය. 2021 වසරේ මුල් භාගයේ දී අතරමැදි භාණ්ඩ ආනයනය කිරීම සඳහා වූ මුළු වියදම, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, සියයට 42.8ක වර්ධනයක් සහිතව එ.ජ. ඩොලර් මිලියන 5,950ක් දක්වා ඉහළ ගියේය.

**ආයෝජන භාණ්ඩ:** යන්ත්‍රසූත්‍ර සහ උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ යන ආයෝජන භාණ්ඩ තෙවර්ගය යටතේ සෑම උප කාණ්ඩයකම ආනයන වියදම සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන්, 2020 වසරේ අනුරූප මාසයට සාපේක්ෂව, 2021 වසරේ ජූනි මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම සියයට 81.1කින් ඉහළ ගියේය. 2021 වසරේ මුල් භාගයේ දී ආයෝජන භාණ්ඩ ආනයනය සඳහා වූ මුළු වියදම, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, සියයට 25.2ක වර්ධනයක් සහිතව එ.ජ. ඩොලර් මිලියන 2,147ක් දක්වා ඉහළ ගියේය.

**ආනයන දර්ශක:** 2021 වසරේ ජූනි මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආනයන පරිමා දර්ශකය සහ ඒකක මිල දර්ශකය පිළිවෙළින්, සියයට 26.7කින් සහ සියයට 24.1කින් ඉහළ ගියේය. මෙමගින්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආනයන වියදම ඉහළ යෑම සඳහා ආනයන පරිමා සහ මිල ගණන් ඉහළ යෑමේ ඒකාබද්ධ බලපෑම හේතු වූ බව නිරූපණය වේ.

**රූප සටහන 6: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: මාසික ආනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | ජූනි 2020 (එ.ජ.ඩො. මිලියන) | ජූනි 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- ජූනි 2020 (එ.ජ.ඩො. මිලියන) | ජන.- ජූනි 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **249.1** | **382.2** | **53.4** | **1,782.1** | **1,912.3** | **7.3** |
| ආහාර හා පාන වර්ග | 101.9 | 165.0 | 61.9 | 787.3 | 914.9 | 16.2 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.0 | 3.6 | 255.1 | 16.8 | 19.6 | 17.0 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 21.0 | 45.8 | 118.1 | 181.1 | 184.4 | 1.9 |
| එළවළු (ආ) | 26.5 | 39.6 | 49.7 | 202.3 | 211.1 | 4.3 |
| මුහුදු ආහාර | 22.6 | 9.6 | -57.6 | 107.5 | 52.7 | -51.0 |
| සීනි හා රසකැවිලි | 12.9 | 23.8 | 84.4 | 116.4 | 206.7 | 77.6 |
| කුළුබඩු | 7.9 | 8.9 | 12.1 | 67.7 | 68.4 | 1.1 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 10.0 | 33.7 | 237.1 | 95.6 | 171.9 | 79.9 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 147.1 | 217.2 | 47.6 | 994.8 | 997.4 | 0.3 |
| පෞද්ගලික රථවාහන | 9.2 | 0.4 | -95.9 | 273.4 | 4.4 | -98.4 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 60.8 | 94.8 | 55.9 | 274.7 | 328.2 | 19.5 |
| ගෘහ උපකරණ | 6.3 | 26.3 | 320.0 | 83.0 | 139.3 | 67.8 |
| රෙදිපිළි හා උපාංග | 17.5 | 15.0 | -14.3 | 111.0 | 105.3 | -5.1 |
| විදුලි සංදේශ උපකරණ | 29.4 | 41.5 | 41.4 | 101.4 | 205.3 | 102.6 |
| ගෘහ හා දැව භාණ්ඩ | 13.3 | 12.7 | -4.5 | 70.5 | 77.7 | 10.2 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 10.7 | 26.5 | 146.9 | 80.9 | 137.3 | 69.6 |
| **2. අන්තර් භාණ්ඩ** | **564.8** | **839.0** | **48.5** | **4,166.8** | **5,950.1** | **42.8** |
| ඉන්ධන | **110.4** | **66.3** | **-40.0** | **1,243.4** | **1,787.2** | **43.7** |
| එයින්, බොරතෙල් | 26.8 | 0.0 | -100.0 | 251.4 | 317.0 | 26.1 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 83.6 | 66.2 | -20.8 | 865.6 | 1,343.5 | 55.2 |
| ගල්අඟුරු | 0.0 | 0.1 | 176.4 | 126.4 | 126.7 | 0.2 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 6.9 | 10.5 | 52.6 | 39.2 | 62.2 | 58.8 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 175.7 | 276.8 | 57.5 | 1,065.6 | 1,451.1 | 36.2 |
| කඩදාසි හා ඝන කඩදාසි | 26.0 | 52.0 | 100.3 | 175.2 | 241.4 | 37.8 |
| කෘෂිකාර්මික යෙදවුම් | 15.8 | 27.9 | 76.7 | 101.8 | 136.9 | 34.5 |
| තිරිඟු හා ඉරිඟු | 27.8 | 43.6 | 56.6 | 156.5 | 184.6 | 17.9 |
| මූල ලෝහ | 13.6 | 57.5 | 322.8 | 171.2 | 354.5 | 107.0 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 28.9 | 80.9 | 179.9 | 228.3 | 403.7 | 76.8 |
| රසායනික නිෂ්පාදිත | 62.9 | 101.9 | 61.9 | 378.9 | 567.4 | 49.7 |
| පොහොර | 22.2 | 2.2 | -90.0 | 107.0 | 97.5 | -8.9 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 13.7 | 37.9 | 176.6 | 110.2 | 199.2 | 80.8 |
| ඛනිජ නිෂ්පාදිත | 18.4 | 14.7 | -20.3 | 78.5 | 75.0 | -4.4 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 42.4 | 66.8 | 57.4 | 310.9 | 389.4 | 25.2 |
| **3. ආයෝජන භාණ්ඩ** | **240.9** | **436.2** | **81.1** | **1,715.2** | **2,147.4** | **25.2** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 146.4 | 270.3 | 84.6 | 990.0 | 1,366.5 | 38.0 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 77.9 | 118.7 | 52.3 | 495.2 | 601.6 | 21.5 |
| ප්‍රවාහන උපකරණ | 16.2 | 46.6 | 187.3 | 228.5 | 177.6 | -22.3 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.3 | 0.6 | 95.8 | 1.5 | 1.7 | 12.5 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.7** | **1.8** | **177.1** | **10.5** | **4.9** | **-53.8** |
| **මුළු ආනයන** | **1,055.5** | **1,659.2** | **57.2** | **7,674.6** | **10,014.7** | **30.5** |
| **එයින් ඉන්ධන නොවන ආනයන** | **945.0** | **1,592.9** | **68.6** | **6,431.2** | **8,227.6** | **27.9** |

(අ) තාවකාලික

(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ දිශාව

ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපා රටවල් සමඟ ශ්‍රී ලංකාව සැලකිය යුතු වෙළඳ අතිරික්ත පවත්වා ගෙන ගියේය. විශේෂයෙන් ම, රෙදිපිළි හා ඇඟලුම් සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්ත වූයේ මෙම රටවල් ය. ප්‍රධාන ආනයන ප්‍රභවයන් වූ ආසියානු රටවල් සමඟ ශ්‍රී ලංකාව විශාල වෙළඳ හිඟයන් පවත්වා ගෙන ගියේය.

**රූප සටහන 8: 2021 වසරේ ජනවාරි - ජූනි කාලපරිච්ඡේදය තුළ ද්වීපාර්ශවික වෙළඳ ශේෂයන්**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

**2020 වසරේ ජූනි මාසයට සාපේක්ෂව 2021 වසරේ ජූනි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ පහළ ගියේය.** ඒ අනුව, 2021 වසරේ ජූනි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත එ.ජ. ඩොලර් මිලියන 478ක් දක්වා සියයට 16.4කින් පහළ ගියේය. කෙසේ වෙතත්, වසරේ මුල් භාගයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත එ.ජ. ඩොලර් මිලියන 3,324ක් දක්වා සියයට 11.6ක වර්ධනයක් වාර්තා කළේය.

**2021 වසරේ ජූනි මාසයේ දී සංචාරක අංශය තුළ සීමිත සංචාරක පැමිණීම් ප්‍රමාණයක් වාර්තා විය.** 2021 වසරේ මැයි මාසයේ 1,497ක් වූ සංචාරක පැමිණීම් ප්‍රමාණයට සාපේක්ෂව 2021 වසරේ ජූනි මාසයේ දී පැමිණි සංචාරකයින් ප්‍රමාණය 1,614ක් විය. 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ පැමිණි 507,311ක් වූ සංචාරකයින් ප්‍රමාණයට සාපේක්ෂව, 2021 වසරේ පළමු භාගය තුළ පැමිණි මුළු සංචාරක පැමිණීම් ප්‍රමාණය 16,908ක් ලෙස වාර්තා විය. 2021 වසරේ ජූනි මාසය තුළ වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් පැමිණි රටවල් වූයේ ප්‍රංශය, චීනය සහ ජර්මනියයි. සංචාරකයින්ගේ පැමිණීම් මත පදනම්ව ඇස්තමේන්තු කරනු ලබන සංචාරක ඉපැයීම් 2021 වසරේ ජූනි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 2ක් විය. 2021 වසරේ පළමු භාගය තුළ සමස්ත සංචාරක ඉපැයීම් ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 23ක් පමණ වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර, එය 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී එ.ජ. ඩොලර් මිලියන 682ක් විය.

**රූප සටහන 9: මාසික සංචාරක පැමිණීම්**




**මූලය:** ශ්‍රී ලංකා සංචාරක සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 10: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**




**මූලයන්:** ශ්‍රී ලංකා සංචාරක සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍ර ලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූලය ලැබීම්

**2021 වසරේ ජූනි මාසය තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ශුද්ධ ගෙවීම් සුළු ප්‍රමාණයක් වාර්තා විය.** 2021 වසරේ පළමු භාගය තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 24ක සමස්ත ශුද්ධ ගෙවීමක් වාර්තා වූ අතර, නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය 2021 වසරේ ජූනි මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 12ක අඩු මට්ටමක පැවතුණි. මේ අතර, 2021 වසරේ ජූනි මාසයේ දී සහ 2021 වසරේ පළමු භාගය තුළ කොළඹ කොටස් වෙළඳපොළ වෙතින්, පිළිවෙළින්, එ.ජ. ඩොලර් මිලියන 6ක සහ එ.ජ. ඩොලර් මිලියන 125ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය.

## ජාත්‍යන්තර සංචිත

**2021 වසරේ ජූනි මාසය අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 4.1ක් වූ අතර, එය මාස 2.6ක ආනයන ආවරණය කිරීමට ප්‍රමාණවත් විය.** දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2021 වසරේ ජූනි මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 6.8ක් වූ අතර, එම ප්‍රමාණය මාස 4.5ක ආනයන ආවරණය කිරීමට ප්‍රමාණවත් විය. ඉහත වාර්තා කර ඇති සංචිත මට්ටම තුළ චීන මහජන බැංකුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර අත්සන් කිරීමට යෙදුණු චීන යුවාන් බිලියන 10ක (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 1.5ක) තුන් අවුරුදු ද්විපාර්ශ්වික මුදල් හුවමාරු පහසුකම ඇතුළත් නොවේ.

**රූප සටහන 11: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

**අන්තර් බැංකු වෙළඳපොළේ බර තැබූ සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකය මාසය අවසානයේ යම් ඉහළ යෑමක් පැවතිය ද, 2021 ජූනි මාසයේ දී සමස්තයක් ලෙස ස්ථාවරව පැවතුණි.** ඒ අනුව, මාසය තුළ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සියයට 0.8කින් අවප්‍රමාණය විය. 2021 වසරේ අගෝස්තු 13වන දින දක්වා කාලය තුළ රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 6.8කින් අවප්‍රමාණය විය. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2021 වසරේ අගෝස්තු 13වන දින දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල, යුරෝ, ස්ටර්ලින් පවුම, ජපන් යෙන්, ඕස්ට්‍රේලියානු ඩොලරය සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව අවප්‍රමාණය විය. ණය නොවන ප්‍රභවයන් තුළින් දළ නිල සංචිත ඉහළ නංවා ගැනීමේ අරමුණ ඇතිව, 2021 වසරේ ජූනි මාසයේ දී මෙන්ම මේ දක්වා මෙම වසර තුළ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් ශුද්ධ පදනම මත විදේශ විනිමය මිල දී ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩව කටයුතු කළේය.

**රූප සටහන 12: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වෙනස් වීම**







**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස් වීම**

| මුදල් ඒකකය | 2019 | 2020 | 2021 (අගෝස්තු 13 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | +0.6% | -2.6% | -6.8% |
| යුරෝ | +2.6% | -11.2% | -2.3% |
| ස්ටර්ලින් පවුම | -2.8% | -6.2% | -7.9% |
| ජපන් යෙන් | -1.0% | -7.5% | -0.1% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | +1.3% | -11.4% | -2.1% |
| ඉන්දියානු රුපියල | +2.6% | 0.0% | -5.4% |

**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම I:

## සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව අපනයන සංයුතිය (අ)

| කාණ්ඩය | ජූනි 2020 (එ.ජ.ඩො. මිලියන) | ජූනි 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- ජූනි 2020 (එ.ජ.ඩො. මිලියන) | ජන.- ජූනි 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **235.4** | **226.8** | **-3.6** | **1,078.2** | **1,278.9** | **18.6** |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 27.1 | 18.0 | **-33.7** | 111.9 | 123.1 | **10.0** |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 4.8 | 4.9 | **2.3** | 32.4 | 31.9 | **-1.6** |
| 05 එළවළු හා පලතුරු | 41.5 | 34.5 | **-16.9** | 177.1 | 206.8 | **16.8** |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 143.5 | 156.3 | **8.9** | 671.6 | 830.3 | **23.6** |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **10.7** | **13.7** | **27.1** | **47.5** | **64.9** | **36.6** |
| 11 පාන වර්ග | 3.3 | 2.6 | **-22.4** | 15.9 | 14.7 | **-7.3** |
| 12 දුම්කොළ හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදිත | 7.4 | 11.1 | **49.1** | 31.6 | 50.2 | **58.6** |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **34.3** | **36.2** | **5.3** | **154.7** | **209.3** | **35.3** |
| 23 සකස් නොකළ රබර් | 3.0 | 2.7 | **-9.3** | 13.8 | 20.8 | **50.0** |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 23.3 | 21.7 | **-7.1** | 93.4 | 116.9 | **25.2** |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **16.7** | **41.3** | **147.3** | **219.5** | **196.7** | **-10.4** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 12.3 | 31.6 | **157.7** | 213.0 | 177.5 | **-16.6** |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 4.4 | 9.7 | **118.5** | 6.5 | 19.1 | **194.4** |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **8.5** | **10.2** | **20.0** | **34.2** | **56.6** | **65.7** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 7.4 | 8.2 | **10.8** | 28.2 | 38.4 | **36.4** |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **20.7** | **27.5** | **32.4** | **96.7** | **139.2** | **43.9** |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **147.6** | **149.4** | **1.2** | **595.4** | **793.0** | **33.2** |
| 62 රබර් නිෂ්පාදන (අන් තැනක සඳහන් නොවන) | 43.8 | 61.5 | **40.6** | 235.5 | 321.0 | **36.3** |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 75.8 | 37.5 | **-50.6** | 193.7 | 208.8 | **7.8** |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 14.0 | 26.5 | **90.2** | 86.7 | 159.6 | **84.1** |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **36.7** | **56.8** | **54.7** | **171.7** | **289.4** | **68.6** |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් (අන් තැනක සඳහන් නොවන) | 23.1 | 29.5 | **27.6** | 104.1 | 155.8 | **49.6** |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **383.4** | **445.2** | **16.1** | **2,015.0** | **2,670.9** | **32.6** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 351.6 | 411.6 | **17.1** | 1,852.4 | 2,461.8 | **32.9** |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **0.0** | **0.0** | _ | **0.0** | **0.3** | _ |
| **මුළු අපනයන** | **894.1** | **1,007.0** | **12.6** | **4,412.8** | **5,699.0** | **29.1** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක් වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017 හි විශේෂ සටහන 04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

**ඇමුණුම II:**

## සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව ආනයන සංයුතිය (අ)

| කාණ්ඩය | ජූනි 2020 (එ.ජ.ඩො. මිලියන) | ජූනි 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- ජූනි 2020 (එ.ජ.ඩො. මිලියන) | ජන.- ජූනි 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **146.7** | **221.8** | **51.2** | **1,056.8** | **1,190.6** | **12.7** |
| 02 කිරි ආශ්‍රිත නිෂ්පාදිත හා කුරුලු බිත්තර | 21.0 | 45.8 | **118.2** | 181.3 | 184.7 | **1.9** |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 22.7 | 9.7 | **-57.3** | 108.0 | 53.2 | **-50.8** |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 28.6 | 46.9 | **63.8** | 172.6 | 202.6 | **17.4** |
| 05 එළවළු හා පලතුරු | 28.7 | 43.4 | **51.3** | 236.5 | 248.7 | **5.2** |
| 06 සීනි, සීනි ආශ්‍රිත සැකසුම් හා පැණි | 12.9 | 23.8 | **84.4** | 116.4 | 206.7 | **77.6** |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 9.6 | 11.9 | **24.0** | 85.7 | 89.3 | **4.1** |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **12.5** | **5.9** | **-52.8** | **51.9** | **37.1** | **-28.5** |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **29.2** | **52.8** | **80.9** | **231.7** | **286.8** | **23.8** |
| 23 සකස් නොකළ රබර් | 11.5 | 33.3 | **188.5** | 93.5 | 176.0 | **88.3** |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 4.9 | 2.6 | **-46.4** | 53.9 | 12.7 | **-76.4** |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **110.4** | **66.3** | **-40.0** | **1,243.4** | **1,787.2** | **43.7** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 95.8 | 43.5 | **-54.6** | 998.3 | 1,493.9 | **49.6** |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 14.6 | 22.6 | **55.1** | 118.7 | 166.6 | **40.3** |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **5.4** | **30.1** | **461.3** | **70.3** | **151.8** | **116.0** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 5.0 | 26.3 | **423.1** | 65.7 | 138.1 | **110.1** |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **170.2** | **278.3** | **63.5** | **975.7** | **1,377.8** | **41.2** |
| 54 බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 58.1 | 90.0 | **54.9** | 258.0 | 297.3 | **15.3** |
| 56 පොහොර | 22.2 | 2.0 | **-90.9** | 106.9 | 97.0 | **-9.2** |
| 57 ප්‍රාථමික ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 16.0 | 59.1 | **268.3** | 149.6 | 299.6 | **100.3** |
| 58 ප්‍රාථමික නොවන ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 9.5 | 19.8 | **108.1** | 65.4 | 86.4 | **32.1** |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **320.1** | **538.6** | **68.3** | **1,997.0** | **2,807.5** | **40.6** |
| 64 කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 24.3 | 50.7 | **108.9** | 169.1 | 231.0 | **36.6** |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 175.5 | 270.2 | **53.9** | 1,011.2 | 1,421.5 | **40.6** |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 50.1 | 47.0 | **-6.3** | 245.3 | 247.9 | **1.0** |
| 67 යකඩ හා වානේ | 24.0 | 72.5 | **202.6** | 239.8 | 428.6 | **78.7** |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **202.2** | **381.8** | **88.9** | **1,655.6** | **1,911.6** | **15.5** |
| 72 ඇතැම් කර්මාන්ත සඳහා විශේෂයෙන් සකස් කරන ලද යන්ත්‍රසූත්‍ර | 28.0 | 66.7 | **137.7** | 201.3 | 322.2 | **60.1** |
| 74 සාමාන්‍ය කාර්මික යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ යන්ත්‍ර කොටස් (අන් තැනක සඳහන් නොවන) | 37.0 | 56.8 | **53.6** | 235.5 | 310.5 | **31.8** |
| 75 කාර්යාලයීය යන්ත්‍රසූත්‍ර හා ස්වයංක්‍රීය දත්ත සැකසුම් යන්ත්‍ර | 17.4 | 31.1 | **78.9** | 83.8 | 161.0 | **92.1** |
| 76 විදුලි සන්දේශ සහ ශබ්ද පටිගත කිරීම හා ප්‍රතිනිෂ්පාදන කටයුතු සඳහා යොදාගනු ලබන උපකරණ | 42.5 | 85.7 | **101.7** | 198.5 | 406.8 | **104.9** |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග (අන් තැනක සඳහන් නොවන) සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් | 34.1 | 67.0 | **96.6** | 252.8 | 359.8 | **42.3** |
| 78 රථවාහන | 25.3 | 39.6 | **56.5** | 440.2 | 186.3 | **-57.7** |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **58.0** | **81.6** | **40.7** | **385.1** | **458.8** | **19.1** |
| 84 නිමි ඇඳුම් හා ඇඟළුම් සකස් කිරීමට ගන්නා උපාංග | 14.1 | 12.1 | **-14.8** | 94.6 | 87.3 | **-7.7** |
| 87 වෘත්තීමය, විද්‍යාත්මක හා පාලන මෙවලම් සහ උපකරණ (අන් තැනක සඳහන් නොවන) | 14.2 | 24.7 | **74.7** | 89.1 | 112.3 | **26.0** |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **0.8** | **1.9** | **133.7** | **7.2** | **5.5** | **-23.4** |
| **මුළු ආනයන** | **1,055.5** | **1,659.2** | **57.2** | **7,674.6** | **10,014.7** | **30.5** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක් වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017 හි විශේෂ සටහන 04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf